# SRI LANKA EXPORT DEVELOPMENT BOARD
# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

## ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීමේ යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවේශ වීමට අවශ්‍ය ප්‍රමිතීන් / සහතික ලබා ගැනීම සඳහා නව අපනයනකරුවන් සංවර්ධන වැඩසටහන් යටතේ ලියාපදිංචි වී ඇති කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ අපනයනයට නැඹුරු කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සමාගම්වලට සහාය වීම සඳහා මූල්‍ය ආධාර යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරයි.

**යෝජනා ක්‍රමය**

මෙම සහාය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන්ට ප්‍රමිතීන් / සහතික ලබා ගැනීමේදී දරන ලද සහතික කිරීමේ පිරිවැය සහ උපදේශන ගාස්තු සඳහා එක් සමාගමකට උපරිම වශයෙන් රුපියල් මිලියන 0.3 ක් (රු. 300,000) දක්වා ප්‍රතිපූරණය කරනු ලබන අතර, ප්‍රමිති සහතිකයේ පිටපතක් ඇතුළුව අදාළ ආධාරක ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රතිපූරණය කරනු ලැබේ.

**මෙම සහාය යෝජනා සඳහා සුදුසුකම් ලැබීමේ ක්‍රියාකාරකම්**

ජාත්‍යන්තර වෙළඳපොළවල අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ප්‍රමිතීන් / සහතික ලබා ගැනීම. (වැඩිදුර විස්තර සඳහා කරුණාකර යෝජනා ක්‍රම මාර්ගෝපදේශ බලන්න)

**සුදුසුකම් ලබන නිෂ්පාදන අංශ**

සැකසූ ආහාර සහ පාන වර්ග, කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන, මත්ස්‍ය නිෂ්පාදන, විදුලි හා ඉලෙක්ට්‍රොනික උපාංග, ආයුර්වේද නිෂ්පාදන (දේශීය ඖෂධ නිෂ්පාදන), පුද්ගලික ආරක්ෂක උපකරණ, අත්කම් නිෂ්පාදන, රසායනික නිෂ්පාදන, ICT / BPM අංශය යනාදී මෙම සහාය සඳහා සුදුසුකම් ලබන නිෂ්පාදන අංශ වේ.

**අයදුම්පත් සහ තේරීම**

මෙම යෝජනා ක්‍රමය සඳහා අයදුම් කිරීමට කැමති අයදුම්කරුවන් නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත 2026 අප්‍රේල් 07 වන දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ – ප්‍රාදේශීය සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටී. අයදුම්පත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) ප්‍රාදේශීය සංවර්ධන අංශයෙන් මෙන්ම මහනුවර, කුරුණෑගල, මාතර සහ යාපනයේ පිහිටි එහි පළාත් කාර්යාලවලින් ලබා ගතහැකිය. අයදුම්පත් EDB වෙබ් අඩවියෙන් (www.srilankabusiness.com) "නිවේදන" කොටස යටතේ බාගත කළ හැකිය. මූලිකව තෝරාගත් අයදුම්කරුවන්ට පමණක් තේරීම් මණ්ඩලයක් ඉදිරියේ සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වීමට ආරාධනා කෙරේ.

**වැඩි විස්තර සඳහා**

ඩී.එම්.පී. දිසානායක මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ 0112303026, විද්‍යුත් තැපැල : dissa@edb.gov.lk හෝ පී.එම්.එම්. සමීම් මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ 0776004263, විද්‍යුත් තැපැල : zameem@edb.gov.lk හෝ කේතකි පැල්පොල මහත්මිය – සහකාර අධ්‍යක්ෂ 0772255647, විද්‍යුත් තැපැල : kethaki@edb.gov.lk අමතන්න.

**ප්‍රාදේශීය කාර්යාල :** මහනුවර – 0812233592, විද්‍යුත් තැපැල : cpo@edb.gov.lk, මාතර – 0412231591, විද්‍යුත් තැපැල : spo@edb.gov.lk, කුරුණෑගල – 0372221972, විද්‍යුත් තැපැල : nwpo@edb.gov.lk සහ යාපනය – 0212215944, විද්‍යුත් තැපැල : npo@edb.gov.lk

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**NDB - EDB කුලුන, අංක 42, නවම් මාවත,**
**කොළඹ 02.**
**www.srilankabusiness.com**